# කිරි පිටි හා පාන් පිටි

අපට පාන් ලැබුණේ පෘතුගීසීන්ගෙන් බව අපි දනිමු. අපට කිරි පිටි පුරුදු කෙළේ කිනම් යුරෝපීය යටත්විජිතවාදීන් දැයි නිශ්චිතව නො දනිමි. කෙසේ වෙතත් කිරි පිටි ද ලැබුණේ යුරෝපයෙනි. අපට වෙනත් පිටි වර්ග නොතිබුණා නො වේ. එහෙත් අප දැන් හොඳින් ම දන්නේ පාන් පිටි හා කිරි පිටි ය. කිරි යනුවෙන් මෙහි දී හැඳින්වෙන්නේ එළකිරි මිස වෙනත් කිරක් ද නො වේ.

කිරි පිටි හා පාන් පිටි ඒකාධිකාරයක් මෙරට ඇත. සමාගම් කිහිපයක් ම  කිරි පිටි ආනයනය කළ ද ආනයනයෙන් සියයට හැටක් පමණ එක් සමාගමකින් පමණක් කෙරෙයි. අප කිරි පිටි හා පාන් පිටිවලට පුරුදු වීමේ විපාකයක් ලෙස මෙරට ජනජීවිතය අවුල්කිරීමට විජාතික සමාහම් කිහිපයකට හැකි වී තිබේ. මේ විජාතික සමාගම් කිරි පිටිවල හා පාන් පිටිවල මිල වැඩිකරන්නේ හුදෙක් ආර්ථික කරුණු නිසා පමණ ද? එහි කිසියම් ආකාරයක හෝ දේශපාලනයක් නැද් ද?

භාණ්ඩවල මිල නියම කෙරෙන්නේ ඉල්ලුම හා සැපයුම මත ය යන්න බටහිර ආර්ථික විද්‍යාවේ ප්‍රාථමික කතාවක් පමණකි. ඉල්ලුම ද සැපයුමක් වන කල භාණ්ඩයේ මිල නියම කරනු ලබන්නේ අවසාන වශයෙන් ගත්කල සපයන්නන් විසිනි. ඉල්ලුම යන්න ඉන්ද්‍රිය පිනවීම හා සම්බන්ධ ය. ඉල්ලුම වැඩිවන්නට පටන් ගත්තේ අවුරුදු පන්සියයකට පමණ පෙර බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ ආරම්භයත් සමගින් ය. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ පදනමේ ඇත්තේ පුද්ගලයා ඉස්මතු කිරීම, පුද්ගලයාගේ ඉන්ද්‍රිය පිනවීමට පහසුකම් සැපයීම හා වියුක්ත චින්තනය ය. බටහිර විද්‍යාව මෙන් ම පසුකලක ධනපති ක්‍රමය ද ඇති වූයේ එවැනි පසුබිමක ය.

පසුගිය දා එක්තරා බටහිර වෛද්‍යවරයකු පොතක් ලියමින් අපට කිරි අවශ්‍ය ද යන ප්‍රශ්නය අසා තිබුණි. ඒ මහතාගේ තර්කණය සැකෙවින් මෙසේ සඳහන් කළ හැකි ය. ළදරුවන්ට කිරි අවශ්‍ය වන්නේ කුඩා කළ ය. වයසින් වැඩෙත් ම වෙනත් ආහාරවලට පුරුදුවීමත් සමග කිරි බීමෙන් ඈත්වීමක් දැකිය හැකි ය. වසු පැටවා ද එළදෙනගෙන් කිරි බොන්නේ කුඩා කළ පමණ ය. ඉන් පසු ඌ තණකොළ හා වෙනත් ආහාර අනුභව කරයි. කිරි බීම ඇතැමුන්ට අගුණ බව අපි දනිමු. වැඩිහිටියන් කිරි බොන්නේ ඇයි ද යන ප්‍රශ්නය ඒ බටහිර වෛද්‍යවරයා නගයි. ඒ මහතා ප්‍රශ්න කරන්නේ කිරි පිටි පමණක් නොව කිරි ද අවශ්‍ය ද යන්න ය. තණකොළ කන වසු පැටවා ද කිරි බීම අත්හරින නමුත් අප ඒ අත්නොහරින්නේ තණකොළ නොකන නිසා ද යන්න ඇසිය හැකි ප්‍රශ්නයකි. අද සමාජයේ ඉස්තරම් දේ හැඳින්වීමට තරුණයෝ හා ළමයි එළකිරි යන පදය යොදා ගනිති. ඉන් කියැවෙන්නේ එළකිරිවලට අද සමාජයේ ලැබී ඇති වැදගත් තැන ය. එහෙත් පැරණි සමාජයේ එළකිරි යන්නට එතරම් වැදගත් තැනක් තිබිණි යැයි කිව නො හැකි ය. පැරණි සිංහලයන් එළකිරිවලට වඩා කිරිවලින් නිපදවාගත් මුදවාගත් කිරි, මෝරු ආදිය ආහාර ලෙස ගත් බව පෙනී යයි. ඇතැම් විට එසේ ආහාරයට ගැනීමෙන් කිරිවල ශරීරයට යම් අහිතකර බවක් තිබිණි නම් ඒ නැතිවන්නට ඇත. භාරතයේ පස්ගෝරස ගැන කියැවෙයි. අදත් ඉන්දියාවේ කිරිවලින් නිෂ්පාදිත ආහාර ජනප්‍රිය වෙයි.

තරුණයන්ට ඉස්තරම් යන්නට සමාන පදයක් බවට පත්කරන ආකාරයට එළකිරිවලට වැදගත් කමක් දී ඇත්තේ එයට කලින් කිරිවලට ඉල්ලුමක් නිර්මාණය කිරීමෙනි. ඒ ඉල්ලුම නිර්මාණය කිරීමේ දී එළකිරිවල ගුණ ගැන කියන බටහිර වෛද්‍ය සහතික ද යොදාගැණිනි. එළකිරිවලට ඉල්ලුමක් නිර්මාණය කිරීමෙන් පසු යුරෝපයේ ඕස්ට්‍රේලියාවේ හා නවසීලන්තයේ සිට ගෙන්වා විකිණිය හැකි  කිරි පිටිවලට ඉල්ලුමක් ඇති කෙරිණි. අද ළදරුවන්ට කිරි පිටි දී ගත නොහැකි වුවහොත් දෙමව්පියන්ට තමන් වරදක් කෙළේ ය යන හැඟීමක් ඇති වෙයි.

පාන් පිටි සම්බන්ධයෙන් ද තත්වය එ පරිදි ය. පෘතුගීසීන් පැමිණ බොහෝ කලක් ගිය ද විසිවැනි සියවස මුල දී පාන්වලට හෝ පාන් පිටිවලට හෝ එතරම් ඉල්ලුමක් තිබී නැත. එහෙත් අපේ ජීවන රටාවන් වෙනස්වීමත් සමග පාන් පිටිවලට ඉල්ලුමක් ඇති කෙරී ඇත. අද වන විට කුඩා නගරවල පවා ඉදි වී ඇති පාන් පිටිවලින් නිෂ්පාදිත ආහාර විකුණන වෙළෙඳසල් මෙන් ම රාත්‍රී ආහාරය සඳහා කෑම ද්‍රව්‍ය විකුණන වෑන් රථ ද පෙන්නුම් කරන්නේ පාන් පිටි අපේ ජීවිතවලට ඇතුල් වී ඇති ආකාරය ය. කලක් බොහෝ දෙනා දැන සිටියේ පාන් හා බනිස් පමණක් වුව ද අද විවිධ වර්ගවල පේස්ට්‍රි ගැන නොදන්නෝ විරල වෙති.

© Prof. Nalin De Silva

පාන් පිටි මෙන් ම කිජි පිටි ද පිටින් ආනයනය කිරීමට සිදු වෙයි. පාන් පිටිවලින් නිර්මාණය කෙරෙන ආහාර අනුභවයට ගැනීමෙන් බත් අනුභවකිරීම අඩු වුවත් අපට අවශ්‍ය හාල් නිෂ්පාදනය කිරීමට අපි අසමත් වී ඇත්තෙමු. ඒ අතර ජාන තාක්‍ෂණය යොදාගෙන නිෂ්පාදනය කෙරෙන විවිධ ආහාර ද්‍රව්‍ය ආනයනය කර ඒ ජනතාවට පුරුදු කර ඉල්ලුමක් නිර්මාණය කිරීමෙන් (සැපයීමෙන්) හා ඒ ආහාර මෙරට නිෂ්පාදනය කිරීමට නොහැකි තත්වයක් ඇතිකිරීමෙන් (උදාහරණයක් ලෙස ඇට නැති පළතුරු) අපේ ආර්ථිකය බටහිර රටවල් ඉදිරියේ දණ ගැස්සවීමට කටයුතු කෙරී ඇත.

අද අප ආහාර අතින් හෝ ස්වයං පෝෂිත නැත. මුළුමනින් ම ස්වයං පෝෂිත ආර්ථිකයක් ඇතිකර ගැනීමට නොහැකි බව කීමට ආර්ථික විද්‍යාඥයකු වීමට අවශ්‍ය නො වෙයි. එහෙත් මෙහි දී ද කිවයුතු කරුණ වනුයේ එසේ භාණ්ඩ ආනයනය නොකර ජීවත්වීමට නොහැකි තත්වයකට අද අප පත්කර තිබීම ය. අපේ අවශ්‍යතා(ඉල්ලුම) බොහෝමයක් යනු අපේ ම අවශ්‍යතා (ඉල්ලුමක්) නොව අපට පටවා ඇති අවශ්‍යතා (ඉල්ලුම්) වෙයි. මිනිසුන්ට නෛසර්ගික ඉල්ලුම් ඇත්තේ කිහිපයක් පමණකි. ඒ ඉල්ලුම් ස්ථානීයව ම සපයා ගත හැකි ය. මිනිසුන්ට හා ගෙවල්වල ඇතිකරන බල්ලන් වැනි සතුන් හැරුණු විට අනෙක් සතුන්ගේ ඉල්ලුම ස්ථානීයව ම සැපයෙයි.

මිනිසුන් හා ඉහත සඳහන් අන්දමේ බල්ලන් ආදීන් හැරුණු කොට අනෙක් සත්තු ස්ථානීයව ම පෝෂණය වෙති. අප එයට ස්වයං පෝෂණය යැයි නො කියන්නේ ඒ සතුන් තම ඉල්ලුම් නිෂ්පාදනයක් ඔස්සේ සපයා නොගන්නා වැවිනි. සතුන් ද සැලකිලල්ට ගත් විට අපට ස්ථානීය පෝෂණය (තරමක් දුර පියාසර කර ඉල්ලුම සපයා ගන්නා පක්ෂීන් ද අයත්වන්නේ ස්ථානීය පෝෂිත ගණයට ය.), ස්වයං පෝකණය හා මිශ්‍ර පෝෂණය ලෙස පෝෂණ ක්‍රම වර්ග කරගත හැකි ය. මිශ්‍ර පෝෂණයේ දී අපේ ඉල්ලුම වෙනත් අය විසින් ද සැපයෙයි. මිශ්‍ර පෝලණය රටක ප්‍රදේශ අතර මෙන් ම රටවල් අතර ද සිදුවෙයි.

අද අප රටේ එක් ප්‍රශ්නයක් වනුයේ අපේ ඉල්ලුමෙන්, අපට ඇති කර ඇති ඉල්ලුමෙන්, විශාල ප්‍රමාණයක් අප රටෙහි ම නිෂ්පාදනය නො කර ගැනීම ය. එයට ඇත්තේ පිළිතුරු තුනකි. එකක් ඒ ඉල්ලුම සපයා ගැනීම සඳහා අප වෙනත් රටවල මිනිසුන්ගේ (හා සතුන්ගේ) ඉල්ලුමෙන් යම් ප්‍රමාණයක් සැපයීම ය. දෙවනුව අපේ ඒ ඊනියා ඉල්ලුමෙන් යම් ප්‍රමාණයක් මෙරට ම නිෂ්පාදනය කිරීම ය. තුන්වැනි පිළිතුර අර ඉල්ලුම් අඩු කිරීම ය. මේ පිළිතුරු තුන ම අඩු වැඩි වශයෙන් සමගාමීව ක්‍රියාත්මක කළ හැකි ය. ජාතික ආඊථිකයක් යන්න ධනපති සමාජවාදී මිශ්‍ර යන ආර්ථික ක්‍රම ගැන කතාකිරීමෙන් ඇතිකරගත හැක්කක් නොව අපේ ඉල්ලුම කුමක් විය යුතු ද කෙසේ සකස් විය යුතු ද වැනි කරුණු සැලකිල්ලට ගැනීමෙන් ඇති කර ගත යුත්තකි. ජාතික ආර්ථිකය අපේ චින්තනය සමග බැඳී ඇත. එහි දී අපේ ආකල්ප වැදගත් වෙයි. ජාතික ආර්ථිකය යනු ඊනියා මිශ්‍ර ආර්ථිකයක් නොවන බව අවධාරණය කළ යුතු ය. බටහිරයන්ගේ සංකල්ප ඔස්සේ ජාතික ආර්ථිකයක් ගොඩනැගීමට කතාකිරීම විහිළුවක් නොව අපරාධයකි.

කිරි පිටි පාන් පිටි හිඟය ඒ ආනයනය කර බෙදාහරින්නන් විසින් ඇතිකරන ලද්දක් බව පැහැදිලි ය. ඒ දේශපාලන මැදිහත්වීමක් ලෙස දැකිය හැකි ය. අද බටහිරයන්ට අවශ්‍ය වන්නේ කොටින්ට එරෙහිව කරන මෙහෙයුම් නතර කිරීම ය. එහි දී ඔවුහු ඊනියා මානව අයිතිවාසිකම්, මාධ්‍ය නිදහස ආදිය මෙන් ම ආර්ථිකය ද දේශපාලන අවියක් ලෙස යොදා ගනිති. බටහිරයන්ට අවශ්‍ය කෙසේ හෝ මේ ආණ්ඩුව ලවා මෙහෙයුම් නතර කර ඊනියා සාම සාකච්ඡා නැවත ඇරඹීම ය. එසේ බැරි නම් ආණ්ඩුව වට්ටවා රනිල් වික්‍රමසිංහ මහතාගේ නායකත්වයෙන් ආණ්ඩුවක් පිහිටුවීම ය. (මේ ආණ්ඩුව වැටීමෙන් ජ වි පෙ ආණ්ඩුවක් ඇති වේ යැයි ඒ පක්ෂයේ සාමාජිකයන් වුව ද විශ්වාස කළුන්නේ යැයි සිතිය නො හැකි ය) අපේ ඊනියා ඉල්ලුම අපට පාලනය කර ගැනීමට නොහැකද වූ විට ඒ ඉල්ලුම ඇති කළ අය අප පාලනය කරති. යුද මෙහෙයුම් ඉදිරියට යත් ම කිරි පිටි පාන් පිටි වැනි ආනයන ඔස්සේ ජනතාව ආණ්ඩුව කෙරෙහි කළ කරවීමට තව තවත් උත්සාහ ගනු ඇත. ඉල්ලුමවත් සැපයුමවත් භාණ්ඩ මිළවත් හුදු ආර්ථික කරුණු නො වෙයි. එහි අපේ ආකල්ප ඔස්සේ සංස්කෘතියත් විවිධ අයගේ දේශපාලනයත් විවිධ අනුපාතවලින් අඩංගු වෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva